සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.

**1.** තවත් පාර්ශ්වයක් සමග තොරතුරු හුවමාරු කර ගන්නේ
(1) සන්නිවේදකයායි. (2) ග්‍රාහකයායි.
(3) දොරටුපාලකයායි. (4) මැදිහත්කරුවායි.
(5) බලපෑම්කරුවායි.

**2.** සන්නිවේදනය විවිධ අවස්ථාවන්ට අනුකූලව සිදුවන්නකි. මෙයින් අදහස් වන්නේ සන්නිවේදනය
(1) අරමුණු සහගත බව ය. (2) සංකේතාත්මක බව ය.
(3) ක්‍රියාපටිපාටියක් බව ය. (4) විවිධාකාර බව ය.
(5) සන්දර්භානුගත බව ය.

**3.** "සන්නිවේදනය ඒක මාර්ගික වූවකි." මෙම කියමන වඩාත් අදාළ වන්නේ
(1) අන්තර් පුද්ගල සන්නිවේදනයට ය. (2) ජන සන්නිවේදනයට ය.
(3) විධිමත් සන්නිවේදනයට ය. (4) සමූහ සන්නිවේදනයට ය.
(5) නිර්වාචික සන්නිවේදනයට ය.

**4.** සන්නිවේදන මූලිකාංගවලට අයත් වන්නේ
(1) සංජානනයයි. (2) සහවේදනයයි.
(3) සන්දර්භයයි. (4) සමාජානුයෝජනයයි.
(5) සංශ්ලේෂණයයි.

**5.** ස්වාධීන රූපවාහිනී සේවය ආරම්භ කරන ලද්දේ
(1) 1966 දී ය. (2) 1973 දී ය. (3) 1979 දී ය. (4) 1982 දී ය. (5) 1995 දී ය.

**6.** සන්නිවේදනයේ දී 'බලපෑම' පිළිබඳ මුල්වරට හඳුන්වාදෙන ලද්දේ
(1) ඇරිස්ටෝටල් ය. (2) ඩඩ්ලි සියර්ස් ය.
(3) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය. (4) එඩ්වඩ් එල්. බර්නීස් ය.
(5) පිලිප් කොට්ලර් ය.

**7.** පොදු අරමුණක් සහිතව එකට එක්ව සිදුකරන සන්නිවේදනය
(1) පුද්ගලාන්තර සන්නිවේදනයයි. (2) මහජන සන්නිවේදනයයි.
(3) විධිමත් සන්නිවේදනයයි. (4) සමූහ සන්නිවේදනයයි.
(5) අතථ්‍ය සන්නිවේදනයයි.

**8.** ජනතාව උනන්දුවක් දක්වන ප්‍රවෘත්ති සහ වෙළඳ දැන්වීම ඇතුලත් දිනපතා හෝ සතිපතා පලකරන ප්‍රකාශනය
(1) පුවත්පතයි. (2) ප්‍රවෘත්ති නිවේදනයයි.
(3) සඟරාවයි. (4) පුවත් හසුනයි.
(5) පොත් පිංචයි.

[දෙවැනි පිටුව බලන්න

9. උපකරණ භාවිතය අවශ්‍ය **නොවන** සන්නිවේදන වර්ගය කුමක් ද?
   (1) විධිමත් සන්නිවේදනය
   (2) ශ්‍රව්‍ය සන්නිවේදනය
   (3) නිර්වාචික සන්නිවේදනය
   (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
   (5) අවිධිමත් සන්නිවේදනය

10. නිර්මාණශීලීත්වයේ මූලිකාංග පිළිබඳ ලියනාඩෝ ඩා වින්චි විසින් පැහැදිලි කළ මූලික කරුණක් වන්නේ
   (1) පරිකල්පනයයි.
   (2) සධූගමනයයි.
   (3) ප්‍රස්තුත ගවේෂණයයි.
   (4) සතතාභ්‍යාසයයි.
   (5) සත්‍යාපනයයි.

11. මහාචාර්ය විල්බර් ශ්‍රාම්ට අනුව ජනමාධ්‍ය මගින් ඉටු කළ යුතු ප්‍රධාන භූමිකා වන්නේ
   (1) ගුරුවරයකුගේ හා ආරක්ෂකයකුගේ භූමිකාවන් ය.
   (2) ආරක්ෂකයකුගේ හා රසඥතාව පුළුල් කිරීමේ භූමිකාවන් ය.
   (3) ගුරුවරයකුගේ, ආරක්ෂකයකුගේ හා සාකච්ඡා මණ්ඩපයක භූමිකාවන් ය.
   (4) දැනුම වර්ධනය කිරීමේ, නවෝත්පාදන විසරණය කිරීමේ හා රසඥතාව පුළුල් කිරීමේ භූමිකාවන් ය.
   (5) නවෝත්පාදන විසරණය කිරීමේ, දැනුම වර්ධනය කිරීමේ හා ප්‍රවෘත්ති බෙදා හැරීමේ භූමිකාවන් ය.

12. දෙහිවල කණිෂ්ඨ විශ්වවිද්‍යාලයේ 'පුවත්පත් කලාවේදය' නැමති පාඨමාලාවේ විෂය නිර්දේශය හඳුන්වා දුන්නේ කවුද?
   (1) මහාචාර්ය විමල් දිසානායක
   (2) ආචාර්ය එඩ්වින් ආරියදාස
   (3) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
   (4) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර
   (5) මහාචාර්ය එම්. බී. ආරියපාල

13. "සංවර්ධනය යනු පූර්ණ සමාජ සංවර්ධනයයි. එයට මානසික, අධ්‍යාත්මික සහ ද්‍රව්‍යමය අවශ්‍යතා ඇතුළත් වේ." මේ මතය දක්වන ලද්දේ කවුද?
   (1) ඩඩ්ලි සියර්ස්
   (2) එඩ්ගා ඕවන්ස්
   (3) මහත්මා ගාන්ධි
   (4) ශ්‍රී නිවාස් මෙල්කොට්
   (5) විල්බර් ශ්‍රාම්

14. යුනෙස්කෝ සංවිධානය මගින් ලංකාවේ සංරක්ෂිත අස්පර්ශ්‍ය උරුමයක් ලෙස පිළිගෙන ඇත්තේ කුමක් ද?
   (1) නාට්‍ය කලාව
   (2) නූල් රූකඩ කලාව
   (3) චිත්‍ර කලාව
   (4) ජනකලාව
   (5) රංග කලාව

15. පාසලේ උදෑසන රැස්වීමේ දී සිසුහු පිරිසක් දේශාභිමානී ගීතයක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කළහ. මෙහි දී යොදා ගත හැකි සන්නිවේදන ස්වරූප වන්නේ
   (1) වාචික, විධිමත් හා සමූහ සන්නිවේදනයයි.
   (2) රූපණය, කථන හා පුද්ගලාන්තර සන්නිවේදනයයි.
   (3) වාචික, නිර්වාචික හා මහජන සන්නිවේදනයයි.
   (4) ශ්‍රව්‍ය, දෘශ්‍ය හා මහජන සන්නිවේදනයයි.
   (5) රූපණය, වාචික හා නිර්වාචික සන්නිවේදනයයි.

16. මනෝවිද්‍යාත්මක අර්ථකථනයට අනුව තම ජීවිතය පාලනය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම
   (1) සහජීවනයයි.
   (2) ස්වයං විශ්වාසයයි.
   (3) ස්වසංකල්පයයි.
   (4) ස්වයං නිර්ණයයි.
   (5) ස්වකැමැත්තයි.

17. මාධ්‍ය සාක්ෂරතාව ගොඩනැගෙන්නේ මූලික වශයෙන්
   (1) ස්ව කේන්ද්‍රය ඇසුරිනි.
   (2) ස්ව කේන්ද්‍රය සහ ඥාන ව්‍යුහ ඇසුරිනි.
   (3) ස්ව කේන්ද්‍රය, ඥාන ව්‍යුහ සහ කුසලතා ඇසුරිනි.
   (4) ස්ව කේන්ද්‍රය, ඥාන ව්‍යුහ, කුසලතා සහ තොරතුරු කට්ටල ඇසුරිනි.
   (5) ස්ව කේන්ද්‍රය, ඥාන ව්‍යුහ, කුසලතා, තොරතුරු කට්ටල සහ ඉලක්ක ඇසුරිනි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**18.** නිශ්චිත ඉලක්කගත කණ්ඩායමකට සන්නිවේදනය කිරීම

(1) මාධ්‍ය අභිසාරීතාවයයි.
(2) නිර්මහාපරිමාණකරණයයි.
(3) ඒකමාර්ගික සන්නිවේදනයයි.
(4) අවගාහතා කේන්ද්‍රියත්වයයි.
(5) මාධ්‍ය නියාමනයයි.

**19.** කිසියම් ආයතනයක බිඳවැටී ඇති ප්‍රතිරූපය ඉහළ නැංවීමට වඩා වැදගත් සේවයක් ලබා ගත හැක්කේ

(1) ජනමාධ්‍යකරුවන්ගෙනි.
(2) අලෙවිකරුවන්ගෙනි.
(3) දැන්වීම්කරුවන්ගෙනි.
(4) සිද්ධි කළමනාකරුවන්ගෙනි.
(5) මහජන සම්බන්ධතා නිලධාරීන්ගෙනි.

**20.** ජෝසප් ආර්. ඩොමිනික්ට අනුව මහජන සම්බන්ධතා හා දැන්වීම්කරණය සඳහා පොදු ලක්ෂණයක් වන්නේ

(1) අලෙවිකරණයයි.
(2) කළමනාකරණයයි.
(3) පෙළඹවීමයි.
(4) අනුග්‍රාහකත්වයයි.
(5) පුද්ගල සම්බන්ධතායි.

**21.** අධ්‍යයනයක දී සමස්ත ජනගහනය නියෝජනය කරන ඒකකය වන්නේ

(1) දත්තයි.
(2) ප්‍රතිශතයයි.
(3) මධ්‍යන්‍යයයි.
(4) මාතයයි.
(5) නියැදියයි.

**22.** මාධ්‍ය කර්මාන්තය තුළ මූල්‍යමය ලාභය සඳහා සිදුකෙරෙන තරගකාරිත්වයට ඉඩ කඩ සලසන මාධ්‍ය ප්‍රවණතාව කුමක් ද?

(1) ගෝලීයකරණය
(2) පරිභෝජ්‍යකරණය
(3) නිර්නියාමනය
(4) මාධ්‍ය අභිසාරීතාව
(5) නිර්මහාපරිමාණකරණය

**23.** ගෝලීයකරණය හා වඩාත් දුරස් වූ සම්බන්ධතාවක් පෙන්නුම් කරන්නේ

(1) සන්නිවේදන තාක්ෂණයේ දියුණුවයි.
(2) සංචාරය හා සංක්‍රමණයේ වර්ධනයයි.
(3) සමාජ තරගකාරිත්වය ඉහළ යාමයි.
(4) පුද්ගල මූලධනය ඒකාරාශී වීමයි.
(5) මානව විවිධතා පුළුල් වීමයි.

**24.** 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 14 (1) (අ) යන්නෙන් දක්වා ඇති හිමිකම

(1) ශ්‍රී ලාංකික පුරවැසියන්ට පමණක් සීමා වූවකි.
(2) ස්වකැමැත්ත මත රිසි අයුරින් භාවිත කළ හැකි ය.
(3) මෙරට ජීවත්වන සියල්ලන්ට භුක්ති විඳිය හැකි වූවකි.
(4) මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගනු නොලබන්නකි.
(5) මහජන ආරක්ෂාව පිළිබඳ නීතියට පමණක් යටත්ව ක්‍රියාත්මක වන්නකි.

**25.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

*A* - ජන සංස්කෘතිය තුළ නිර්මාණ අකර්තෘකාරක වේ.
*B* - ජනප්‍රිය සංස්කෘතිය තුළ මානවවාදය උසස් ලෙස සැලකේ.
*C* - ගෝලීය සංස්කෘතිය තුළ ජාතික සංස්කෘතික අනන්‍යතා හීන වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) *A* පමණි.
(2) *B* පමණි.
(3) *A* හා *B* පමණි.
(4) *A* හා *C* පමණි.
(5) *B* හා *C* පමණි.

**26.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) කෝලම් යන වචනය දෙමළ භාෂාවෙන් බිඳී ආවකි.
(2) ප්‍රවෘත්තියක් ග්‍රාහකගත වීම දොරටුපාල කාර්යය මත රඳා පවතී.
(3) සමූහ සන්නිවේදනය හුදු ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් තීරණය වේ.
(4) භාෂාවේ නිර්මාණශීලීත්වය මුද්‍රිත මාධ්‍යයෙහි ද දක්නට හැකි ය.
(5) ලිඛිත සන්නිවේදනය තුළ නිර්වාචික සන්නිවේදන විධි ඇතුලත් විය හැකි ය.

**27.** මාධ්‍ය සාක්ෂරතාව ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා 'තොරතුරකට' අදාළව දැනගත යුතු වඩාත් වැදගත් ප්‍රශ්නය තෝරන්න.

(1) සිදුවීම කුමක් ද?
(2) සම්බන්ධ පුද්ගලයින් කවුරුන් ද?
(3) සිදුවූයේ කොහේ දී ද?
(4) සිදුවූයේ කුමන වේලාවක දී ද?
(5) සිදුවූ ආකාරය කෙසේ ද?

28. 'මාධ්‍ය ආචාර ධර්ම හා මාධ්‍ය මාර්ගෝපදේශ' පිළිබඳ වඩාත් ගැළපෙන වරණය තෝරන්න.

(1) වෘත්තීමය වගකීමකි
(2) නීතිමය බැඳීමකි
(3) සදාචාරාත්මක භාවිතයකි
(4) පෞද්ගලික චර්යාවකි
(5) මාධ්‍ය නිදහසේ දර්ශකයකි

29. විදෙස්ගත වීම සඳහා නිවසින් පිටව යන තම පුතු නොපෙනී යන තුරු ඒ දෙස බලා සිටි මවගේ ඇසට කඳුලක් නැඟුනි. මෙම සිදුවීම රූප මාධ්‍යයට නැඟීමට වඩාත් යෝග්‍ය කැමරා රූප රාමු වන්නේ පිළිවෙලින්,

(1) මධ්‍යම රූපය හා මධ්‍යම සමීප රූපයයි.
(2) අතිදූර රූපය හා ඉතා සමීප රූපයයි.
(3) අතිදූර රූපය හා මධ්‍යම රූපයයි.
(4) සමීප රූපය හා අතිසමීප රූපයයි.
(5) ඉතා දුර රූපය හා මධ්‍යම රූපයයි.

30. සමීක්ෂණ ක්‍රියාවලියක දී කිසියම් සිදුවීමක වැඩිම වාර ගණනක් පෙන්නුම් කරන්නේ

(1) මධ්‍යස්ථයයි.
(2) මානයයි.
(3) මධ්‍යන්‍යයයි.
(4) අනුපාතයයි.
(5) පන්ති ප්‍රාන්තරයයි.

31. තාක්ෂණික දෘෂ්ටිකෝණයෙන් සන්නිවේදන ක්‍රියාවලිය විමසා බලන්නේ සන්නිවේදනය පිළිබඳ

(1) ෂැනන් සහ වීවර් ආකෘතිය පමණි.
(2) HUB ආකෘතිය පමණි.
(3) ඔස්ගුඩ් සහ ශ්‍රාම් ආකෘතිය පමණි.
(4) ෂැනන් සහ වීවර් මෙන් ම HUB ආකෘතියයි.
(5) HUB මෙන් ම ඔස්ගුඩ් සහ ශ්‍රාම් ආකෘතියයි.

32. සන්නිවේදන ආකෘති අතර සෘජුව හෝ වක්‍ර ලෙස ප්‍රතිපෝෂණය ගම්‍යමාන වන්නේ

(1) ඔස්ගුඩ් සහ ශ්‍රාම්ගේ ආකෘතියේ පමණි.
(2) HUB මෙන් ම ඔස්ගුඩ් සහ ශ්‍රාම්ගේ ආකෘතියේ ය.
(3) ඇරිස්ටෝටල් මෙන් ම HUB ආකෘතියේ ය.
(4) ෂැනන් සහ වීවර්ගේ මෙන් ම ඇරිස්ටෝටල් ආකෘතියේ ය.
(5) ඔස්ගුඩ් සහ ශ්‍රාම්ගේ මෙන් ම ෂැනන් සහ වීවර්ගේ ආකෘතියේ ය.

33. ජනමාධ්‍ය ඇතුලු විවිධ සන්නිවේදන අවස්ථාවන්හි ඝෝෂා උද්ගත වීම අපේක්ෂා කළ හැකිය. ඝෝෂා සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලබන්නේ සන්නිවේදනය පිළිබඳ

(1) ෂැනන් සහ වීවර් ආකෘතියේ දී පමණි.
(2) ෂැනන් සහ වීවර් ආකෘතියේ දී මෙන් ම ඇරිස්ටෝටල් ආකෘතියේ දී ය.
(3) ඇරිස්ටෝටල් ආකෘතියේ දී මෙන් ම ඔස්ගුඩ් සහ ශ්‍රාම්ගේ ආකෘතියේ දී ය.
(4) ඔස්ගුඩ් සහ ශ්‍රාම්ගේ ආකෘතියේ දී මෙන් ම HUB ආකෘතියේ දී ය.
(5) HUB ආකෘතියේ දී මෙන් ම ෂැනන් සහ වීවර් ආකෘතියේ දී ය.

34. ස්ව කේන්ද්‍රය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) එය කුසලතා පදනම්ව නිර්මාණය වන්නකි.
(2) එය ගොඩනැගීමේ දී දැනුම ප්‍රධාන ලක්ෂණය වේ.
(3) තොරතුරු කට්ටල ආශ්‍රිතව එය වර්ධනය වේ.
(4) එය දුර්වල වන විට ජනමාධ්‍ය බලපෑම්වලට පුද්ගලයා යටත් වනු පෙනේ.
(5) ජනමාධ්‍ය අන්තර්ගතය හේතුකොටගෙන එහි වෙනස්කම් ඇති විය හැකිය.

35. ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන පිළිබඳ ලිපියක් අන්තර්ජාලය ඔස්සේ කියවමින් සිටි නිමල්ට එහි එක් තැනක මහ බැංකු වාර්තාව වෙත යොමු වීමට සැබැඳියක් හමු විණි. ඔහු ඒ ඔස්සේ ගොස් මහ බැංකු වාර්තා කිහිපයක් කියවා වැඩිදුර තොරතුරු ලබා ගන්නා ලදී. මෙහි දී නිමල් යොදා ගත් නව මාධ්‍ය ලක්ෂණ වන්නේ පිළිවෙලින්,

(1) අංකිතකරණය, අධිපාඨනීයත්වය හා දත්ත සංචිතයි.
(2) ජාලගතකරණය, අන්තර් ක්‍රියාකාරීත්වය හා දත්ත සංචිතයි.
(3) අධිපාඨනීයත්වය, ස්වයංකරණය හා වේගවත් සංදේශකරණයයි.
(4) අංකිතකරණය, ස්වයංකරණය හා ජාලගතකරණයයි.
(5) ස්වයංකරණය, අංකිතකරණය හා අධිපාඨනීයත්වයයි.

36. ශ්‍රී ලංකාවේ තොරතුරු අයිතිය පිළිබඳ පනතට අනුව තොරතුරු ලබාදීමට සෘජුව බැඳී **නොමැති** ව්‍යුහ/ආයතන වන්නේ

(1) දෙපාර්තමේන්තු ය.
(2) සංස්ථා ය.
(3) මණ්ඩල ය.
(4) දේශපාලන පක්ෂ ය.
(5) පළාත් පාලන ආයතන ය.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**37.** තනි පුද්ගලයා මූලික කරගනිමින් සිදුකරන ප්‍රචාරණ කාර්ය සමග (Personal Casting) වැඩි ම සම්බන්ධතාව පෙන්නුම් කරන්නේ

(1) පුවත්පතයි.
(2) ගුවන්විදුලියයි.
(3) රූපවාහිනියයි.
(4) නව මාධ්‍යයි.
(5) සමාජ මාධ්‍යයි.

**38.** ගැටලුවලින් මිදී විකල්ප වෙත යොමු වීම සඳහා ජනමාධ්‍ය භාවිත කිරීම

(1) අපසරණයයි.
(2) ප්‍රජානනයයි.
(3) විශුක්තිකරණයයි.
(4) සුපරීක්ෂණයයි.
(5) නිෂ්කර්ෂණයයි.

**39.** පර්යේෂණ දත්ත පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පර්යේෂණ වාර්තාවක් මගින් ලබා ගන්නා දත්ත ප්‍රාථමික දත්ත වේ.
(2) ගුණාත්මක දත්ත කිසිවිටෙකත් සංඛ්‍යාත්මකව ඉදිරිපත් කළ නොහැකි ය.
(3) ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යාත්මකව ඉදිරිපත් කිරීම අපහසු ය.
(4) දත්ත රැස් කිරීමේ දී වඩාත් යෝග්‍ය වන්නේ ප්‍රශ්නාවලි ක්‍රමයයි.
(5) ප්‍රශ්නාවලියක් මගින් ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක දත්ත ද ලබා ගත හැකි ය.

**40.** මහජන සන්නිවේදනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) එය වාචික ස්වරූපයක් ගැනීමට ඉඩ ඇති නමුත් කිසිවිටකත් නිර්වාචික ස්වරූපයක් නොගනියි.
(2) එය මතයක් නිර්මාණය කිරීමට යොදා ගත හැකි නමුත් විවිධ පාර්ශ්වවල අවධානය දිනා ගැනීමට භාවිත කළ නොහැකි ය.
(3) එය සන්නිවේදන ස්වරූපයක් වන නමුත් තාක්ෂණික මෙවලම් භාවිතයට ගනී.
(4) සන්දේශය ග්‍රහණය කර ගත හැකි සීමාවක ග්‍රාහකයා රැඳී සිටිය යුතු අතර ජනසමූහයක් පොළඹවා ගැනීම සඳහා භාවිත කළ හැකි ය.
(5) මැතිවරණ රැලි මහජන සන්නිවේදන අවස්ථාවකට නිදර්ශකයක් වන නමුත් සංගීත සංදර්ශන ඊට අයත් නොවේ.

**41.** මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

*A* - එය නිරායාසයෙන් වර්ධනය වේ.
*B* - එය පාසල් අධ්‍යාපන ක්‍රියාවලියට බද්ධ විය යුතු ය.
*C* - එය ජනමාධ්‍යකරුවන් සතු විය යුතු කුසලතාවකි.
*D* - එය සංජානනය කරන තොරතුරු මත පදනම් වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) *A*, *B* හා *C* නිවැරදි අතර *D* වැරදි වේ.
(2) *A*, *B* හා *D* නිවැරදි අතර *C* වැරදි වේ.
(3) *A*, *C* හා *D* නිවැරදි අතර *B* වැරදි වේ.
(4) *B*, *C* හා *D* නිවැරදි අතර *A* වැරදි වේ.
(5) *A*, *B*, *C*, *D* යන සියල්ලම නිවැරදි වේ.

**42.** මාධ්‍ය නියාමනය පිළිබඳ වඩාත් ගැලපෙන පාර්ශ්ව යුගලය තෝරන්න.

(1) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය – සංස්කාරක
(2) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම – බෙදාහරින්නා
(3) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය – පාඨකයා
(4) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම – දැන්වීම්කරු
(5) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය – ශ්‍රාවකයා

**43.** මාධ්‍ය හිමිකරුවන්ගේ ග්‍රහණයට හසු නොවී සිටීමට හැකි පෞරුෂයක් ගොඩනැගෙන්නේ

(1) මාධ්‍ය අභිසාරීතාවෙනි.
(2) මාධ්‍ය සාක්ෂරතාවෙනි.
(3) මාධ්‍ය නිදහසෙනි.
(4) මාධ්‍ය සංස්කෘතියෙනි.
(5) මාධ්‍ය ආර්ථිකයෙනි.

**44.** සිද්ධි කළමනාකරණයේ මූලික පියවරට අයත් වන්නේ

(1) සැලසුම, පිළියෙල කිරීම, විමසුම හා ක්‍රියාවයි.
(2) සැලසුම, විමසුම, ක්‍රියාව හා බෙදාහැරීමයි.
(3) විමසුම, පිළියෙල කිරීම, ක්‍රියාව හා පාලනය කිරීමයි.
(4) ක්‍රියාව, සැලසුම, නිරීක්ෂණය හා පිළියෙල කිරීමයි.
(5) විමසුම, පිළියෙල කිරීම, ක්‍රියාව හා නිරීක්ෂණයයි.

**45.** මහජන සම්බන්ධතා පිළිබඳ විස්තර ඇතුළත් පහත වගුව සලකන්න.

| වර්ග | විධික්‍රම |
|---|---|
| *A.* රාජ්‍ය මහජන සබඳතා | *1.* මාධ්‍ය සාකච්ඡා |
| *B.* ආයතනික මහජන සබඳතා | *2.* සමාජ වගකීම |
| *C.* වෘත්තීය මහජන සබඳතා | *3.* ප්‍රභූ සම්බන්ධතා |
| *D.* ව්‍යාපාර මහජන සබඳතා | *4.* ආයතනික සමාජ වගකීම (CSR) |
| *E.* මාධ්‍ය මහජන සබඳතා | *5.* කීර්තිය |

ඉහත මහජන සම්බන්ධතා වර්ග හා විධික්‍රම ගැලපූ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.

(1) *A1, B2, C3, D4* සහ *E5*
(2) *A2, B3, C4, D5* සහ *E1*
(3) *A3, B4, C5, D1* සහ *E2*
(4) *A3, B5, C2, D4* සහ *E1*
(5) *A5, B4, C3, D2* සහ *E1*

**46.** 1970 දශකයේ අග භාගයේ දී මැක්බ්‍රයිඩ් කොමිසම ආරම්භ කරන ලද්දේ
(1) අන්තර්ජාතික සම්බන්ධතා තහවුරු කිරීමටයි.
(2) ආයතනික තාක්ෂණික ගැටලු නියාමනයටයි.
(3) මහජන සේවා සංකල්පය ස්ථාපනය කිරීමටයි.
(4) ගෝලීය මාධ්‍ය නිරූපණය සාධාරණීකරණය කිරීමටයි.
(5) ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරීම අධ්‍යයනය කිරීමටයි.

**47.** ශ්‍රී ලංකාවේ යෝජිත ජනමාධ්‍ය ප්‍රතිපත්තියේ මූලික හරය වන්නේ සහනියාමනය පිළිගන්නා බවයි. මෙයින් අදහස් වන්නේ
(1) රජය මගින් මාධ්‍ය පාලනය කළ යුතු බව ය.
(2) ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුව මාධ්‍ය ව්‍යුහය සකස් විය යුතු බව ය.
(3) ජනමාධ්‍ය ආයතන මගින් නියාමන ක්‍රියාවලිය සිදුකරගත යුතු බව ය.
(4) ජනමාධ්‍ය නියාමනයට රජය කිසිසේත් ම මැදිහත් නොවිය යුතු බව ය.
(5) මාධ්‍ය නියෝජිතයන්ගේ මැදිහත් වීම මත රජයේ සහයෝගීතාවෙන් සිදු විය යුතු බව ය.

**48.** මාධ්‍ය නිලධාරියාගේ කාර්යභාරයට අයත් **නොවන්නේ**
(1) ආයතනයේ කාර්ය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමයි.
(2) ආයතනය වෙනුවෙන් මාධ්‍ය සාකච්ඡාවලට සහභාගී වීමයි.
(3) ආයතනයේ මූල්‍ය හා පිරිවැය කළමනාකරණය කිරීමයි.
(4) අර්බුද කළමනාකරණය සඳහා මාධ්‍ය යොදා ගැනීමයි.
(5) ප්‍රවර්ධනය සඳහා විවිධ මාධ්‍ය අන්තර්ගත නිර්මාණය කිරීමයි.

**49.** ආහාර කර්මාන්ත ශාලාවක නිෂ්පාදනයක් පරිභෝජනය හේතුවෙන් විශාල පිරිසක් රෝගී වූ බැවින් එහි නිෂ්පාදන කටයුතු අත්හිට වූ බව ජනමාධ්‍ය වාර්තාකර තිබුණි. එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමේ දී ආයතනයේ කීර්තිනාමය පවත්වාගෙන යාමට මහජන සම්බන්ධතා නිලධාරියා ලෙස ඔබ විසින් යෝජනා කරන්නේ කුමක් ද?
(1) ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කිරීමයි
(2) මාධ්‍යවේදීන්ට කර්මාන්තශාලා සංචාරයක් සංවිධාන කිරීමයි
(3) වීඩියෝ පටයක් මුදා හැරීමයි
(4) මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමයි
(5) ජනමාධ්‍යවේදීන්ට ත්‍යාග ලබා දීමයි

**50.** සංවර්ධන සන්නිවේදනය හා සබැඳි මුල් කාලීන තත්ත්ව පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජාතික සංවර්ධනයේ ඇති වැදගත්කම මුල්වරට හඳුනා ගන්නා ලද්දේ ඩඩ්ලි සියර්ස් විසිනි.
(2) සංවර්ධන සන්නිවේදනය පහළ සිට ඉහළට සිදුවිය යුතු බව බටහිර ශාස්ත්‍රඥයන්ගේ පිළිගැනීමයි.
(3) සූරා කෑම සහ යැපීම ආර්ථිකය බටහිර හා තුන්වන ලෝකයේ රටවල් අතර සබඳතාවල දී කැපී පෙනුණි.
(4) ආර්ථික සුබසාධනයේ දර්ශක ලෙස සමාජ අලෙවිකරණය, නවීකරණය සහ මාධ්‍ය ප්‍රවර්ධනය වැනි සාධක ප්‍රධාන විය.
(5) 1960 ගණන්වල දී ලතින් ඇමෙරිකානු නවීකරණ වැඩසටහන සාර්ථක වීම සංවර්ධන සන්නිවේදනයේ කැපීපෙනෙන සන්ධිස්ථානයකි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

**29 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **40**කි.

1. (i) වර්තමාන සමාජය තුළ භාවිත කරන අවිධිමත් සන්නිවේදන ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

   (ii) අතර්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

   (iii) සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයක් ලෙස ජන කවියෙහි දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

   (iv) නිර්මාණශීලිත්වයේ අර්ථ සිද්ධි පිළිබඳ ජේම්ස් වොට්සන් සඳහන් කළ කරුණු **හතරක්** දක්වා ඉන් **දෙකක්** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

2. (i) යටත්විජිත සමයේ සිට දේශීය වශයෙන් වාර්තා හා කෙටි චිත්‍රපට නිෂ්පාදනයට මුල් වූ රාජ්‍ය ආයතනය නම් කරන්න. (ලකුණු 04)

   (ii) නිර්වාචික සන්නිවේදනයේ අංග **දෙකක්** නිදසුන් ඇසුරෙන් පහදන්න. (ලකුණු 08)

   (iii) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

   (iv) ඔබ තෝරාගත් ජනමාධ්‍යයක් ඇසුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග **හතරක්** පිළිබඳ විග්‍රහ කරන්න. (ලකුණු 16)

3. මාධ්‍ය මගින් ග්‍රාහකයා කෙරෙහි ඇති කරන සෘණාත්මක බලපෑම් අවම කිරීමේ දී නීති පැනවීමට වඩා අප සියලුදෙනා වෙත වගකීමක් පැවරී ඇති බව ගුරුවරයා අවධාරණය කළේ ය.

   (i) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 04)

   (ii) HUB ආකෘතියෙහි අන්තර්ගත පහත කරුණු කෙටියෙන් විස්තර කරන්න.

   (අ) දොරටුපාලකයෝ

   (ආ) බලපෑම් (ලකුණු 08)

   (iii) සමාජ මාධ්‍ය මගින් සිදුවිය හැකි **සෘණාත්මක** බලපෑම් **තුනක්** උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 12)

   (iv) 'සමාජ වගකීම වෙනුවෙන් නියාමනයේ අවශ්‍යතාව' යන මාතෘකාව යටතේ පහත නියාමන ආයතනයන්හි කාර්යභාරය සහ වගකීම් උදාහරණ සහිතව විස්තර කරමින් පුවත්පතකට **වචන 250ට** නොඅඩු ලිපියක් ලියන්න.

   (අ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

   (ආ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ලකුණු 16)

[දෙවැනි පිටුව බලන්න.

4. මාධ්‍ය සාක්ෂරතාව සහිත මාධ්‍යවේදීන් හා ග්‍රාහක පිරිසක් බිහි කිරීම පාසලෙන් ආරම්භ කළ යුතු බව මාධ්‍ය දින උත්සවයේ දී ආරාධිත කථිකයා ප්‍රකාශ කළේ ය.
   (i) ජනමාධ්‍යයන්හි විශේෂ ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   (ii) සුපරීක්ෂණය හා අර්ථකථනය යන ජනමාධ්‍ය කාර්ය **දෙක** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) උසස් මාධ්‍ය සාක්ෂරතාවක් ඇති කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** ශ්‍රව්‍යදෘශ්‍ය මාධ්‍යයට විශේෂිතව විස්තර කරන්න. (ලකුණු 12)
   (iv) විචාරශීලී ග්‍රාහකයකු සතුවිය යුතු පහත සඳහන් කුසලතා රූපවාහිනී මාධ්‍ය භාවිතයේ දී වැදගත් වන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
      (අ) විශ්ලේෂණය
      (ආ) ඇගයීම
      (ඉ) කාණ්ඩකරණය
      (ඊ) වියුක්තිකරණය
   (ලකුණු 16)

5. (i) පර්යේෂණවල දී යොදාගන්නා දත්ත වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   (ii) සංවර්ධනය පිළිබඳ නිර්වචනයක් දක්වා එය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) සමීක්ෂණ ක්‍රමවේදය භාවිතයේ වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
   (iv) පහත අවස්ථාවන්හි දී මහජන සම්බන්ධතා ක්‍රියාවලිය සිදුවන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
      (අ) ආයතනික මහජන සම්බන්ධතා
      (ආ) ව්‍යාපාරික මහජන සම්බන්ධතා
   (ලකුණු 16)

6. 'සිනමාව හා සමාජය' යන තේමාව යටතේ වැඩමුළුවක් සංවිධාන කිරීමට ඔබ පාසලේ මාධ්‍ය ඒකකය සැලසුම් කරයි.
   (i) පිලිප් කොට්ලර් දක්වන සිද්ධි කළමනාකරණයට අදාළ සිද්ධි වර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 04)
   (ii) මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව කරුණු **දෙකක්** යටතේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) ඉහත වැඩමුළුවට අදාළව සිද්ධි කළමනාකරුවෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ නම් ඔබගේ භූමිකාවට අදාළ කාර්ය **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
   (iv) මෙම වැඩමුළුවේ දී සභාව ආමන්ත්‍රණය කරන්නෙකුට යොදා ගත හැකි සමූහ සන්නිවේදන විධික්‍රම **හතරක්** යෝග්‍ය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

7. (i) එවරට් එම්. රොජර්ස් හඳුන්වා දුන් සංවර්ධනයට අදාළ න්‍යාය නම් කරන්න. (ලකුණු 04)
   (ii) සංවර්ධනය සඳහා සන්නිවේදනයේ දී 'අවශ්‍යතා කේන්ද්‍රීයත්වය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පහදන්න. (ලකුණු 08)
   (iii) 2003 බුද්ධිමය දේපළ පනතට අනුව 'සාධාරණ භාවිතය' යොදා ගත හැකි පහත අවස්ථා නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.
      (අ) විචාරය
      (ආ) ඉගැන්වීම
      (ඉ) ප්‍රවෘත්ති වාර්තාකරණය
   (ලකුණු 12)
   (iv) නිර්මාණපරිමාණකරණයේ ස්වභාවය මූලික කරුණු **හතරක්** ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 16)

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න